**ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2023**

-----------------------------------------------------------------------------------------------------------

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීම.**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.4 2022 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් හා වගකීම්වල තත්ත්වය**

ආයතනය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---:|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 163,361,208 |
| ජංගම වත්කම් | 4,299,622 |
| | -------------- |
| **මුළු වත්කම්** | **167,660,830** |
| | ======== |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 165,680,032 |
| වගකීම් | 1,980,798 |
| | --------------- |
| **මුළු බැරකම්** | **167,660,830** |
| | ========= |
| මුළු ආදායම | 47,564,977 |
| මුළු වියදම | 44,664,903 |
| | --------------- |
| **අතිරික්තය** | **2,900,074** |
| | ========= |

## 2. විගණන නිරීක්ෂණ

### 2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 අංක 32 දරන උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනත (සංශෝධන) | | | |
| (i) 10 (අ) වගන්තිය | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස්දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි. | ජාත්‍යන්තර උපදේශක සභාව පත් කිරීම සඳහා 2023 නොවැම්බර් 17 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මේ සම්බන්ධව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii)10ඉ(1) වගන්තිය හා 10(2) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දින එනම් 2006 සැප්තැම්බර් 29 දින සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය, මෙම ආයතනය වෙත පවරා ගතයුතු අතර එය ආයතනයේ ඒකකයක් වශයෙන් පුහුණු වැඩසටහන් හා වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතුය. තවද එහි සේවයේ නියුක්තව සිටි නිලධරයන් හා සේවකයින් ද, ආයතනයේ නිලධරයන් හා සේවකයින් ලෙස සැලකිය යුතුය. එසේ වුව ද එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | 2020 වසර දක්වා පුහුණු ආයතනය පාඨමාලා පැවැත්වීමෙන් උපයාගත් මුදල් මගින් එහි සියලු වියහියදම් සිදුකොට ඇත. 2020 වසරේ සිට ආයතනයේ කුලිය ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව පුහුණු ආයතනය හා එහි කාර්යය මණ්ඩලය මෙම ආයතනයට පවරාගත යුතුය. |
| (iii) 10ඉ(2)(i) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දිනට පෙර බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | පුහුණු ආයතනය පවත්වා ගෙන යන ගිණුම්වල ඇති මුදල් ආයතනය ස්වඋත්සාහයෙන් උපයාගත් බැවින් හා එහි වියදම් සඳහා රජයෙන් ප්‍රතිපාදන නොලැබෙන බැවින් එම මුදල් වෙනත් ගිණුමකට මාරු කිරීමට කටයුතු කර නැත. | පනතේ විධිවිධාන අනුව පුහුණු ආයතනයේ බැංකු ගිණුමේ පවතින ශේෂය පවරාගත යුතුය. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ආයතනයේ පුහුණු අංශය විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට ස්ථාවර තැන්පතු 10 ක රු.23,156,825 ක් හා භාණ්ඩාගාර බිල්පත්වල රු.2,923,679 ක් ආයෝජනය කර තිබුණි. | මින් ඉදිරියට අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට හැකියාවක් ඇති විටකදී ලබාදී ඇති උපදෙස් පරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |
| (ඇ) 2009 මැයි 26 දිනැති අංක 39 | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ පනත් | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත | කළමණාකරණ සේවා අනුමැතිය |

| | | | | |
|---|---|---|---|---|
| | දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (01) ඡේදය | මගින් ආයතනයේ සේවක මණ්ඩලය වෙත වැටුප් හා දීමනා නියම කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, වැටුප් හා සේවක සංඛ්‍යා කමිටු නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය රහිතව විෂයභාර අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ගෙවීම් ලබා දීම අනුමත කිරීමෙන් වැළකී සිටිය යුතුය. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විදේශ අමාත්‍යාංශයෙන් ආයතනය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 04 දෙනෙකු සඳහා එකතුව රු.785,000 ක් සමාලෝචිත වර්ෂයේදී දීමනා ලෙස ගෙවා තිබුණි. | අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරන ලද නිලධාරින් සඳහා දිරිදීමනා වශයෙන් මාසිකව ගෙවීම් සිදු කර ඇති බව පිළිගනිමි. බඳවා ගැනීමේ පටිපාටි සඳහා අනුමැතිය ලැබුණු පසුව කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රහිතව දීමනා නොගෙවිය යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද මෙහෙයුම් අත්පොත | | | |
| | (i) 3.2(i) වගන්තිය | කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටි සකස්කර අනුමැතියට ඉදිරිපත් කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පටිපාටිවල අඩුපාඩු සකස්කර ඉදිරිපත් කිරීමට දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| | (ii) 6.6 වගන්තිය | වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසන්වී මාස පහක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් ආයතනය 2007 වර්ෂයේ සිට වාර්ෂික | 2007 සිට 2015 දක්වා හා 2016 සිට 2020 දක්වා වාර්ෂික වාර්තා 2024 ජූලි 23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර එම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට |

| | | |
|---|---|---|
| වාර්තා සහාගත කර නොතිබුණි. | වාර්තාවල අඩුපාඩු නැවත සකස් කර එවන ලෙස දන්වා ඇත. ඒ අනුව එම වාර්තා හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2021 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රිගත Laptop පරිගණක ශේෂය 16 ක් වුවද තථ්‍ය ශේෂය 15 ක් වූයෙන් එක් Laptop පරිගණකයක හිඟයක් පැවතිණි . | 2018 වර්ෂයේ දී එක් Laptop පරිගණකයක් ශ්‍රී ලංකා යුධ හමුදාවට ලබා දුන් බවට දන්වා ඇතත් ලිඛිත සාක්ෂි සොයා ගත නොහැකි බව කාරුණිකව දන්වමි. | භාණ්ඩ ඌණතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |